Workers of the world, unite !

मार्क्सवाद-लेनिनवाद-माओवाद - जिन्दावाद !
Long Live Marxism-Leninism-Maoism !

# एकीकृत नेपाल कम्युनिष्ट पार्टी (माओवादी)
# Unified Communist Party of Nepal (Maoist)
## केन्द्रीय समिति
## Central Committee

प.सं. : 2069/70
च.नं. : 628

Mrs Sonia Gandhi
President, Indian National Congress
New Delhi, India

**Re: Message of Condolence**

Madam Gandhi

I and our party, UCPN-Maoist, are deeply shocked and saddened by the demise of leaders and workers of your party—the Indian National Congress—in the recent attack in Chhattisgarh of India unleashed by Indian Maoists.

The incident of violent attack has drawn the attention of and our party expressing serious concern on the incident joins with you which 27 people including leaders and workers of the Indian National Congress were killed and 32 others, including Congress central leader VC Shukla, were injured. We believe that any kind of solution can and should be sought and found in a peaceful manner, which is the beauty of democracy. I, personally and also on behalf of my party, express deepest condolences to the families of those killed and wish for the speedy recovery of those injured in the incident.

I am optimistic that your party will soon recover from this moment of utmost sorrow and would rededicate itself to the welfare of the people of India.

With warmest regards

Prachanda

Puspa Kamal Dahal 'Prachanda'
Chairman
UCPN-Maoist
Kathmandu, Nepal
May 28, 2013

पेरिसडाँडा (कोटेश्वर), काठमाडौं, फोन : ९७७-१-४६०२२८८, फ्याक्स : ९७७-१-४६०२२८९
Email : ucpnm.chq@gmai..com, www.facebook.com/unifiedmaoist, www.twitter.com/UCPNMaoist, Website : www.ucpnmaoist.org

සිංහල අන්තර්ගතය එක් කළ පසු ලිපිය පහත පරිදි වේ

[illegible]

ලෝකයේ කම්කරුවනි සමගිවව්! මාක්ස්වාදය-ලෙනින්වාදය-මාඕවාදය දිගුකල් දිනේවා!

# एकीकृत नेपाल कम्युनिष्ट पार्टी (माओवादी)

# එක්සත් නේපාල කොමියුනිස්ට් පක්ෂය (මාඕවාදී)

## केन्द्रीय समिति

## මධ්‍යම කාරක සභාව

प.सं. : 2069/70
च.नं. : 628

एकीकृत नेपाल कम्युनिष्ट पार्टी (माओवादी) 2001 1949 केन्द्रीय समिति Central Committee Unified Communist Party of Nepal (Maoist)

සෝනියා ගාන්ධි මහත්මිය
සභාපති, ඉන්දියානු ජාතික
කොංග්‍රසය
නව දිල්ලි ඉන්දියාව

ශෝකය ප්‍රකාශ කිරීම සම්බන්ධව

ගාන්ධි මහත්මිය

ඉන්දියානු මාඕවාදීහු විසින් මෑතදී චට්ස්ගාර්හි එල්ල කරන ලද ප්‍රහාරය හේතුවෙන් - ඉන්දියානු ජාතික කොංග්‍රසය වන ඔබේ පක්ෂයේ නායකයින් සහ ක්‍රියාකාරිකයින් මරණයට පත්වීම ගැන මා සහ අපේ පක්ෂය, එක්සත් නේපාල කොමියුනිස්ට් පක්ෂය (මාඕවාදී), තදබල කම්පනයට සහ සංවේගයට පත් වූහ.

කොංග්‍රසයේ මධ්‍යම නායක වීසී ශුක්ලා ඇතුළුව 32 දෙදෙනෙකුට තුවාල සිදු කළ සහ ඉන්දියානු ජාතික කොංග්‍රසයේ නායකයින් සහ ක්‍රියාකාරිකයින් ඇතුළු තවත් 27 දෙනෙකු ජීවිතක්ෂයට පත් කළ ප්‍රචණ්ඩකාරී ප්‍රහාරය අපේ අවධානයට ලක් වී ඇති අතර අපේ පක්ෂය ඔබ සමග එක්ව සාතිශය සංවේගය පළ කර සිටී. ඕනෑම වර්ගයක විසඳුමක් සාමකාමී මාවත ක්‍රමයක් හරහා ලබා ගත හැකි බව අපි විශ්වාස කරමු. මම පෞද්ගලිකවම සහ මගේ පක්ෂය වෙනුවෙන් මරණයට පත් වූ අය වෙනුවෙන් අත්‍යන්ත ශෝකය ප්‍රකාශ කර සිටින අතර තුවාලවූ අයට ඉක්මන් සුවය පතමි.

මේ බලවත් ශෝකී තත්ත්වයෙන් ඔබ ඉක්මනින් යථා තත්ත්වයට පත්වී ඉන්දියානු ජනතාවගේ සුභසිද්ධිය වෙනුවෙන් කැප වෙනු ඇති බව සර්වශුභවාදීව මම සිතමි.

උණුසුම් ශුභාසිංසන සමග

Prachanda

පුෂ්ප කමල් දහාල් ප්‍රචණ්ඩා
සභාපති
UCPN-මාඕවාදී
කත්මණ්ඩු, නේපාලය
මැයි 28, 2013

पेरिसडाँडा (कोटेश्वर), काठमाडौं, फोन : ९७७-१-४६०२२८८, फ्याक्स : ९७७-१-४६०२२८९
Email : ucpnm.chq@gmai..com, www.facebook.com/unifiedmaoist, www.twitter.com/UCPNMaoist, Website : www.ucpnmaoist.org

[redacted]

[illegible]

# පාර්ලිමේන්තුවාදය යනු සදාකල් එරෙන උගුලකි! එය නිර්ධනීන්ගේ උපායයක් නොවේ! විප්ලවය වැළැක්වීමට සතුරා පටවනු ලැබූ ව්‍යාජයකි!

2013 මැයි 25 වන දින මහජන විමුක්ති ගරිල්ලා හමුදාව කොංග්‍රස් පක්ෂයේ ඉහළ පෙළේ නායකයින් සහ මහේන්ද්‍ර කර්මා ඇතුළු ෆැසිස්ට්වාදී ජන පීඩකයින් ඇතුළු ආරක්ෂක රිය පෙළට දැවැන්ත ප්‍රහාරයක් එල්ල කිරීමෙන් සතුරන් 27 දෙනෙකු සමූලඝාතනය කරනු ලැබූ අතර අවම වශයෙන් 30 ක් වත් බරපතළ තුවාල සහිත තත්ත්වයට පත් වූහ. ලොව පුරා විප්ලවවාදීහු මේ උද්වේගකර පණිවිඩයෙන් උද්දාමයට පත්වන විට නේපාල කොමියුනිස්ට් පක්ෂයේ හිටපු සභාපති වූ අන්ත සංශෝධනවාදයෙකු වූ ප්‍රචණ්ඩා එම සිදුවීමෙන් කොංග්‍රස් පක්ෂයට සිදු වූ හානිය ගැන ශෝකය ප්‍රකාශ කරමින් කොංග්‍රස් පක්ෂයේ නායිකාව වූ ෆැසිස්ට්වාදී සෝනියා ගාන්ධිට පණිවිඩයක් යවන ලදි. දිගින් දිගටම විප්ලවීය ව්‍යාපාරය තුළ වැරදි න්‍යායන් සහ වැරදි භාවිතාවන් යොදවමින් නේපාල විප්ලවය දියකර හැරීමේ ද්‍රෝහී පාවාදීමේ කාර්යයේ නියැලී ලෝක අධිරාජ්‍යවාදයේ දෙපතුළ යට දණින් වැටුණු ඔහු දැන් සිය ස්වභාවය එළිපිටම නිරුවත් කොට හමාරය.

**පාර්ලිමේන්තුව හරහා විප්ලවය කළ හැකිය යන න්‍යාය නව සංශෝධනවාදයයි (නූතන සංශෝධනවාදයයි).** සාමකාමී ලෙස පාර්ලිමේන්තු මාවත හරහා විප්ලවය කරා ගමන් කළ හැකිය යන මිත්‍යාව එය හරහා පීඩිතයින්ගේ හිස්ගෙඩි තුළට දමා නිර්ධන පංති අරගල තිඹිරිගෙයි තුළදීම වළලා දැමීම එහි අරමුණයි. මේ රැවටිලිසහගත න්‍යාය ඉදිරිපත් කරන ලද්දේ ද්‍රොහී කෘෂෙව් විසිනි. ඒ 1962 දී ය. ඔහුගෙන් සංශෝධනවාදී අධිරාජ්‍යගැති ප්‍රතිපත්ති සහ ක්‍රියාමාර්ගයන් හරහා සෝවියට් දේශයේ සමාජවාදය වේගයෙන් බිඳ වැටුණු අතර ලොව විශාලතම සමාජවාදී භූමි භාගය පාවා දීමෙන් සතුරාට මිළ කළ නොහැකි සේවයක් ඉටු කළහ. ඉන් පසු ලෝකය පුරා නිර්ධනීන්ගේ ගෞරවයට පාත්‍ර වූ සමාජවාදී සොවියට් දේශය සමාජ අධිරාජ්‍යයක් බවට පත් වූහ. එම න්‍යායෙහි පැහැදිලි අරමුණ වූයේ විප්ලවය දියත් කිරීමෙන් ලෝකය පුරා සිටි විශාල ප්‍රමාණයක පීඩිත කොටස් වළක්වාලීමයි. එය එසේම සිදු වූ අතර ඔවුන්ගේ සංශෝධනවාදී න්‍යාය භාවිතා කිරීමෙන් පාර්ලිමේන්තුවාදී ලෙස බලය අත්පත් කරගැනීමට ක්‍රියාකළ ඉන්දුනීසියන් කොමියුනිස්ට් පක්ෂය සමූලඝාතනය කොට අවසන් කිරීමට එහි ප්‍රතිගාමී රජයට උදව් කරන ලද්දේද සෝවියට් සමාජ අධිරාජ්‍යයි. එයින් 30 ලක්ෂයකට වැඩි ඉන්දුනීසියන් කොමියුනිස්ට් පක්ෂයේ සාමාජිකයින් සහ ජනතාව මරුමුවට පත් වූහ. එලෙසම සමාජවාදය පාර්ලිමේන්තුව තුළින් අත්හදා බලන්නට උත්සාහ දැරූ චිලී කොමියුනිස්ට් පක්ෂයේ අනුග්‍රහය ලද චිලියේ සැල්වදොර් අයිලන්ඩේගේ පාලනය ඉතා ශෝචනීය ලෙස අවසන් විය. චිලී කොමියුනිස්ට් පක්ෂය වනසා දමනු ලැබූ අතර චිලියේ ප්‍රගතිශීලී කළාකරුවන් සහ විප්ලවවාදී තරුණයින් ඇතුළු ජනතාව සිය ලේ වලින් මිල ගෙවූහ.

මෙලෙමස නූතන සංශෝධනවාදය අනුගමනය කරනු ලැබූ අයවලුන්ට අත්වූ ඉරණම් දෙකකි. එනම් මහා සංහාරයකින් ශෝචනීය ලෙස අවසන් වීම හෝ අධිරාජ්‍යවාදයේ දෙපතුළ යට වැඳ වැටී නිර්ධන පංතියේ ද්‍රෝහීන් බවට පත් වීමයි. මෙය වැළැක්විය නොහැකිය. හැමවිටම වැරදි සහගත න්‍යායන් වැරදි සහගත සහ අසාර්ථක භාවිතාවන් සඳහා මං සලසා ඇත. ඔවුහු සිදු කරන්නේ රතු සායම තවරාගනිමින් ''අපි විප්ලවවාදී වම්හයි'' සිය පිටේ වාමාංශික, කොමියුනිස්ට්, සහ මාඕවාදී ලේබල් අලවාගෙන රතු කොඩියක් ඔසවා, පීඩිතයින්ගේ දෙනෙත් සිය පරම සතුරා කෙරෙන් ඉවත් කොට ගෙන සංශෝධනවාදීන්ගේ ඊනියා රතු කොඩිය පාමුළට සමස්ත ජන විඥාණය එක්තැන් කොට දොර වසා අගුලු ලෑමයි. සංශෝධනාවදයේ අරමුණ, පාර්ලිමේන්තුවාදයේ අරමුණ ඉතා පැහැදිලිය. එනම් ඉතිහාසයේ ප්‍රගමනකාරී ඉදිරි ගමන නැමැති රෝදය ආපස්සට කරකවාලීමයි. **ඔවුහු විසින් නිර්ධන පංති අරගලවලදී ලොව පුරා සුවහසක් වූ නිර්ධන පංතියේ අභීත සටන්කාමී දූ පුතුන් විසින් වගුරා ලූ රක්ත රුධිරයට මොහොතක් මොහොතක් පාසා අවමන් කරනු ඇත්තාහ. සියළු සංශෝධනවාදී මාවත්වලින් ඉවත්වෙනු! අව්‍යාජ නිර්ධන පංති ධජය යටතේ සමගි වනු! සියළුම වර්ගයේ සංශෝධනවාදයේ කුණු කන්දල්, ආත්මයන් සහ යදම්, බැමි පුපුරුවා හරිනු!**

විප්ලවය යනු පැරණි සමාජය එහි මුල් සමගම පෙරළා භස්ම කොට එය මත නව සමාජයක් ඉදි කිරීමයි. සමාජවාදී විප්ලවය යනු ධනවාදී සමාජය මුලිනුපුටා දමා එහි අළු මත සමාජවාදී සමාජය ඉදි කිරීමයි. විප්ලවය යනු පුළුල් බහුජනතාව සමග හරි හරියට බද්ධ වී නිර්ධන පංති නායකත්වය යටතේ සිදු කරනු ලබන දැවැන්ත විපර්යාසීය කාර්යයකි. සියළුම විප්ලවයන්ගේ කේන්ද්‍රීය ප්‍රශ්නය දේශපාලන බලය ලබා ගැනීම පිළිබඳ ප්‍රශ්නයයි. දේශපාලන බලය නොමැතිව අවසානයේ සියල්ල මිත්‍යාවක් වනු ඇත. මෙය ඉතා පැහැදිලිව වටහා ගත යුතුය. එය හමුදා කුමන්ත්‍රණයක් හෝ රාජ්‍ය පෙරළා දැමීමේ කුමන්ත්‍රණයක් නොවේ. එය නිර්ධනීන් අතට රාජ්‍ය බලය ලබා දෙනු ලබන ප්‍රචණ්ඩකාරී අරගලයයි. විප්ලවයෙහි ගාමක බලවේගය වන්නේ නිර්ධන පංතිය වන අතර කිසි කලෙක සුළු ධනේශ්වර පංතියට එහි නායකත්වයට ගත නොහැක. එලෙස සිදු කොට කිසි කලෙක නිර්ධන පංතියට දේශපාලන බලය ලබා ගත නොහැක. පාර්ලිමේන්තුව යනු ධනේශ්වර උපකරණයකි. මැතිවරණ ක්‍රමය යනු ධනේශ්වර රාජ්‍ය යන්ත්‍රය දක්කාගෙන යෑම පිණිස අටවනු ලැබූ සදාකල් එරෙන උගුලකි. නිර්න පංතියට කිසි

කලකෙ ධනේශ්වර පංතියේ උපකරණ භාවිතා කොට විප්ලවය මුදුන් පමුණුවා ගත නොහැක. මෙය මාක්ස්වාදයේ මූලික නීති රීති වලම පැහැදිලිවම එහි ආදි කතෘවරු විසින්ම දක්වා තිබේ.

ලොව කිසිදු විප්ලවයයක් බුමුතුරුණු මතින් ගොස් සිප වැළඳ දිනා ගත හැකි එකක් නොවේ. කිසවෙක් එලෙස විශ්වාස කරන්නේනම් හෝ එම ක්‍රියාවලිය තුළ සිටින්නේනම් එනම් නූතන සංශෝධනවාදය භාවිතාවේ යොදවන්නේනම් ඔවුන් පැහැදිලිවම විප්ලවය පාවාදෙන ලෝක අධිරාජ්‍යවාදයට වන්දිභට්ඨකම් කරන දුෂ්ඨ පංති ද්‍රෝහීන් මිස වෙන කිසිවෙකුත් නොවේ. නූතන සංශෝධනවාදය භාවිතාවේ යොදවන ලොව පුරා සිටින සියළුම දේශපාලන පක්ෂ පංති සතුරන් මිස විප්ලවවාදී පක්ෂ නොවේ. ඔවුහු අධිරාජ්‍යගැති දේශීය පාලකයින්ට තවදුරටත් සූරාකෑම පිණිස මුක්කු ගසන ද්‍රෝහීන් මිස වෙන කිසිවෙකුත් නොවේ.

නූතන සංශෝධනවාවයට එරෙහිව සටන් කරන ලද්දේ සහෝදර මාඕ සේතුං සහෝදරයාගේ නායකත්වයෙන් යුතු චීන කොමියුනිස්ට් පක්ෂයයි. ඔහු විසින් මාක්ස් ලෙනින්වාදී දර්ශනය තව දුරටත් සංවර්ධනය කරමින් එය තව දුරටත් ඉහළට ඔසවා තබන ලදි. ඔහු විසින් නිර්ධන පංතියට එක් කරන ලද ඓතිහාසික සංවර්ධනය මගින් ලෝක නිර්ධන පංතියා වඩා බල ගැන්වී ඇත. එය මාක්ස්-ලෙනින්-මාඕවාදය ලෙස අද ව්‍යවහාර කරයි. අද කොමියුනිස්ට්වාදියෙකුට (මාඕවාදියෙකට) විප්ලවය සඳහා ගත හැකි එකම මග සතුරා සමග සාමදානයක් නොපතන මහජන යුද්ධයේ මාවතයි.

ලෝක අධිරාජ්‍යවාදය මෙතරම් ගෝලීය ලෙස සංවිධානාත්මක යුගයක නිර්ධනීහු කළ යුත්තේ ජාත්‍යන්තර ලෙස සංවිධානය වී ලොව පුරා විප්ලවයේ ගිණි පුපුර ඇවිලවීමට ඇප කැප වීමයි. විප්ලවීය ව්‍යාපාර නොමැත්තේ කොතැනද එතැනට ගිණි පුපුරු විසි කළ යුතුය. ගිණි පුපුරු පවතින්නේ කොතැනද එතැන පතන් ගිණි ඇවිලවිය යුතුය. ප්‍රාදේශීයව ගත් කළ සියලුම විප්ලවීය අරගලවල ක්ෂණික අභිලාශය එම භූමි තුළ විප්ලවය කිරීම වුවද එහි දේශපාලන දිශානතිය සහ අරමුණ කේන්ද්‍රගත විය යුත්තේ ලෝක නිර්ධන පංති විප්ලවය සිදු කිරීමේ අපරාජිත ගමන කරාය. මෙය සියළුම විප්ලවීය කොමියුනිස්ට්වරුන්ගේ දෙවුර මත පැටවී ඇති ප්‍රධානතම සහ භාරදූරතම කාර්යයද වන්නාහ. ඉන්දියානු කොමියුනිස්ට් පක්ෂයෙ (මාඕවාදී) සහෝදරවරු මෙහි තීරණාත්මක කාර්යයක් ඉටු කරමින් සිටී. එය අධිරාජ්‍යවාදයට නැවැත්විය හැකි නොවේ. ඉදිරියේදී සතුරා වඩ වඩාත් ප්‍රබල ප්‍රහාර බලාපොරොත්තු විය යුත්තාහ. එය විසින් මහා පරිමාණ සමූලඝාතක ප්‍රහාර සතුරා වෙත මුදා හරින දිනය වැඩි ඈතක නොවේ. අපගේ සහෝදරත්වයේ උණුසුම් දෑත් මෙන්ම ලෝක නිර්ධන පංතියේ උණුසුම් දෑත් එය ලෝක අධිරාජ්‍යවාදී ගිජුලිහිණියන්ගේ පව්ටු නිය පහරින් සුරැකීම පිණිස අත්වැල් බැඳගෙන සූදානමින් සිටී.

අප සටන් කරන්නේ ලෝක නිර්ධන පංති විප්ලවය කිරීම සඳහා යැයි හඬගා කියන්නට අපට හැකි කමක් තිබිය යුතුය. එම මාවතට ප්‍රවේශ වී සිටින අපි කුමන මිලක් ගෙවා හෝ එය ඉටු කිරීමේ සදාතනික අරගලකාරී මාවත තුළ ගමන් කරමින් අවසාන අරමුණ මස්තක ප්‍රාප්ත කර ගත යුත්තෝ වෙමු. එනම් සූරාකෑමේ දුෂ්ට අවතාරයේ සෙවණැලි වලින් විමුක්ත වූ කොමියුනිස්ට් සමාජය කරා දිවෙන ගමන අනවරතව රැකගත යත්තාහ.

MRL -13/06/20 LF